# දෙවන වාර පරීක්ෂණය - 2018

**පෙරදිග සංගීතය**

**08 ශ්‍රේණිය**

නම :

කාලය පැය 02 යි.

I කොටස

- **නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01. සරිග , සසධප... ආදී ස්වර ඛණ්ඩ යෙදෙන රාගාශ්‍රිත ස්වර ස්ථාපන ගීතය අයත් රාගය,

(1) බිලාවල් (2) භූපාලි

(3) කාෆි (4) යමන්

02. සිරස නමමු මව් පොළොවට... මෙම ගීතය ගැයෙන ස්වර ප්‍රස්තාරයේ නොයෙදෙන ස්වර යුගලයකි.

(1) ස , ප (2) ම , ස

(3) ස , රි (4) ම , නි

03. දීප්චන්දි තාලයට අනුව නිර්මාණය වූ ගීතයකි.

(1) ලංකා ලංකා පෙම්බර ලංකා

(2) රන්වන් කරල් සැලෙයි සන්සුන් නමින් බරව

(3) රත්න දීප ජන්ම භූමි

(4) ඇසේ මතුවන කඳුළු බිඳුගෙන

04. ස්වර ලිපියක VERSE යනුවෙන් හඳුන්වන්නේ,

(1) පෙර වාදන කොටසය (2) අන්තරා කොටසය

(3) අතුරු වාදන කොටසය (4) ස්ථායි කොටසය

05. ඉපල් පිටින් ගහන අච්ච' මෙම ගී පාදය අයත් වන්නේ,

(1) කමත් ගීතයකට ය (2) සේ ගීතයකට ය

(3) ගොයම් ගීතයකට ය (4) නෙළුම් ගීතයකට ය

- **නිවැරදි පිළිතුර යොදා හිස්තැන් පුරවන්න.**

(භජන් , ඒ.ආර්. රහ්මාන් , ජෝන් ද සිල්වා , නව නාට්‍ය , ඩබ්.ඩී. අමරදේවයන්)

06. 'රෝජා' චිත්‍රපටයේ සංගීත නිර්මාණය කරන ලද්දේ .................................................. විසිනි.

07. 'අන්න බලන් සඳ-රන්තැටියෙන්...' යන ගීතය .................................................. ගීතයකි.

08. ශ්‍රී වික්‍රම නූර්තියේ නිර්මාතෘවරයා .................................................. මහතාය.

09. හින්දුස්ථානි සංගීතයේ එන සරල ශාස්ත්‍රීය ගායනාවකි. ..................................................

10. 'අඩවන් වූ දෙනෙතින් ගලනා' ගීතය .................................................. විසින් ගායනා කර ඇත.

- **හරි නම් (✓) ලකුණ ද, වැරදි නම් (✗) ලකුණද වාක්‍යය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.**

11. බුද්ධං සරණේ.... මෙහි අගයකතිමත් ගණන මාත්‍රා හයකි. ( )

12. ලංකාවේ නාඩගම් නාට්‍ය සඳහා උතුරු ඉන්දීය සංගීත ආභාෂය ලැබී ඇත. ( )

13. බටහිර සංගීතයේ මාත්‍රා 2 ක වටිනාකම 'ක්‍රොචට්' යනුවෙන් නම් කරයි. ( )

14. 'සිරිසරු සාරකෙතේ' යන ගීතය ආනන්ද සමරකෝන් මහතාගේ නිර්මාණයකි. ( )

15. සිතාරයේ පමමු තත 'ප' ස්වරයට සුසර කෙරේ. ( )

- **නිවැරදි පිළිතුර වරහන තුලින් තෝරා යටින් ඉරක් අඳින්න.**

16. ජප් තාලයේ මාත්‍රා බේදී යන්නේ (2/3 බැගිනි , 3/ බැගිනි)

17. ගී පාදයක ඇති ලඝු හා ගුරු මාත්‍රා සංඛ්‍යාවේ එකතුව (සඳැස්මත් / ගීමත්) නම්වේ.

18. බටහිර සංගීතයේ යෙදෙන 'මිනිම්' වටිනාකම මාත්‍රා (01 කි / 02 කි)

19. X 2 0 3 ලෙසින් තාල සංකේත (දාදරා / දීප්චන්දි) තාලයේ යෙදී ඇත.

20. සුනිල් සාන්තයන් ගයන තෙල් ගාලා හිස පීරන් නෑනෝ.... යන ගී පාදය නිර්මාණය වී ඇත්තේ (නෙලුම් ගී / ගොයම් ගී) ඇසුරිනි.

## II කොටස

**පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 03 කට පිළිතුරු සපයන්න.**

01. (i) 'ම' සහ 'නී' යන ස්වර යොදා නොගන්නා රාගය කුමක් ද? (ල. 02)

(ii) කැමති රාගයට අයත් ස්වර ස්ථාපන ගීතයක ස්ථායි කොටස ගීත ස්වර ප්‍රස්තාර කරන්න. (ල. 08)

02. (i) ගැමි ගීත පිළිබඳව කෙටියෙන් හඳුන්වන්න.

(ii) පහත දැක්වෙන ගැමි ගී වර්ග කෙටියෙන් හඳුන්වන්න.

කමත් ගී

නෙලුම් ගී

(iii) ඔබ උගත් කමත් ගීයක් හා නෙලුම් ගීයක් ලියා දක්වන්න.

03. (i) සරල ගීතයක අඩංගු වන පහත කොටස් වලින් 2 ක් කෙටියෙන් හඳුන්වන්න.

INTRO

MELODY

BIT

(ii) පහත ගීතයන්හි ගී පද රචකයන් නම් කරන්න.

සසර වසන තුරු නිවන් දකින තුරු

දවසක් පැල නැති හේනේ

(iii) ඔබ උගත් පියගුණ වරුණ ගීතයක ස්ථායි කොටස හා එක් අන්තරා කොටසක පද මාලාව ලියන්න.

04. (i) නාඩගම් නාට්‍ය 02 ක නම් ලියන්න.

(ii) නාඩගම් නාට්‍ය හා නූර්ති නාට්‍ය ශෛලීන් දෙක සම්බන්ධ තොරතුරු පහත කරුණු යටතේ වෙන් කරන්න.

යොදාගත් සංගීත සම්ප්‍රදාය

සංගීත භාණ්ඩ

රංග භූමිය

නිර්මාතෘවරු

(iii) ඔබ පන්ති කාමරයේ දී ඉගෙනගත් නාඩගම් ගීතයක මුල් කොටස ලියා දක්වන්න.